ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021 - 11 - 08

පැමිණිලිකරු : එම්.ඩී.එස්. අමරසිරි මහතා.
අංක : 28/2, මිඩියල් පාර,
රත්මලාන.

වින්දිත පාර්ශවය : එම්.වී. ඉන්ද්‍රානි මිය

වගඋත්තරකරුවන් : උ.පො.ප. සපුමල් ඒකනායක මහතා,
පොලිස් ස්ථානය,
පොලොන්නරුව.

පැමිණිලි අංකය : **HRC/2600/16**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම බිරිඳ වන එම්.වී. ඉන්ද්‍රානි නැමැත්තිය 2016.07.03 වන දින දෙහිවල පොලිසියේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන අමානුෂික අන්දමින් පහරදී ඇති බවයි.

වින්දිත තැනැත්තිය විසින් පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා ගෘහ සේවිකාවක් ලෙස කටයුතු කරන බවත්, ඒ අනුව 2016.06.10 වන දින දෙහිවල ශ්‍රී මහාබෝධි විහාරයේ නිවසක සේවය කර තමාගේ ඇස් වල ශල්‍ය කර්මයක් කිරීමට අවශ්‍ය වූ බැවින් සේවයෙන් ඉවත් වී නිවසේ රැඳී සිටි අතර, තමා සේවය කළ නිවසේ හිමිකරු විසින් වින්දිත තැනැත්තියට දුරකථන ඇමතුමක් ලබාදෙමින් දුරකථනයක් නැති වී ඇති බවට දන්වන ලද බවත්, පසුව තමා 2016.06.16 වන දින ශල්‍ය කර්මය සඳහා රෝහලට ඇතුළු වූ බවත්, ප්‍රතිකාර ලබා සති දෙකකට පමණ පසු තමා සේවය කළ නිවසට ගිය බවත්, එවිට අදාළ භාණ්ඩ හමු



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නොවූ බව නිවසේ හිමිකරුගේ දියණිය ප්‍රකාශ කරන ලද බවත්, එම නිසා දෙහිවල පොලිස් ස්ථානයට ගොස් කටඋත්තරයක් ලබාදෙන ලෙසට දැන්වූ බවත්. ඒ අනුව ඇයත් සමග දෙහිවල පොලිස් ස්ථානයට ගිය අතර එවිට තමාගෙන් ප්‍රකාශයක් ලබාගෙන තමාව අත්අඩංගුවට ගත් බවත් සඳහන් කර ඇත.

එසේ අත්අඩංගුවට ගෙන පොලිස් නිලධාරියෙක් විසින් කාමරයකට රැගෙන ගොස් වම් බාහුවට පොලු වලින් පහරදුන් බවත්. තවත් නිලධාරියෙක් විසින් කම්මුල් පෙදෙසට පහරදුන් බවත්. පසු දින එනම්, 2016.07.03 වන දින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවත්. එදින ඇප මත නිදහස් වී එදිනම කළුබෝවිල රෝහලේ වාට්ටු අංක :、11 වෙත ඇතුළු වී ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

වින්දිත තැනැත්තිය විසින් අදාළ සිද්ධිය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක්ද ඉදිරිපත් කර ඇති අතර. පැමිණිල්ලට අදාළ සාක්ෂි වශයෙන් එම්.ඩී දර්ශන යන අය විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින්, වින්දිත තැනැත්තිය තමාගේ මව බවත්. ඇය 2016.06.16 වන දින ඇසට කාචයක් බද්ධ කළ බවත්. 2016.07.02 වන දින මව සේවය කළ නිවසට ගිය බවත්. නැවත ඒමට ප්‍රමාද වූ නිසා ඒ ගැන සොයා බැලීමට පියාගේ ඉල්ලීමට අනුව තමා අදාළ නිවසට ගිය විට මෙහේ එහෙම අයෙකු නොමැති බව එම නිවසේ නිවැසියන් ප්‍රකාශ කරන ලද බවත්, ඇයව දෙහිවල පොලිසියට රැගෙන ගිය බවට ප්‍රකාශ කළ බවත්ය. ඒ අනුව තමා දෙහිවල පොලිසියට ගොස් තම මව බැලූ බවත්. එවිට තම මවට පහරදී ඇති බවත්. පහරදීම නිසා කිහිපවතාවක් ක්ලාන්ත වී ඇති බවත්. දැනගත් බවද සඳහන් කර ඇත. පසුව ඇප ලබාගැනීමෙන් අනතුරුව කළුබෝවිල රෝහලට ඇතුලත්වී ප්‍රතිකාර ලබාගත් බවද සඳහන් කර ඇත.

පහරදීම සනාථ කිරීම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇති අතර. කළුබෝවිල රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් අදාළ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත ලබාදී ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවත්. පළවන තුවාලය දකුණු බාහුවේ ද. දෙවන තුවාලය වින්දිත තැනැත්තියගේ පිටේ වම් පැත්තේ ද ඇති බවත් සඳහන් වන අතර. අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ අදාළ තුවාල රෝගියාගේ ඉතිහාසය හා සැසඳෙන බවයි.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරු විසින්ද පැමිණිල්ලට අදාළව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර. එහි සඳහන් කර ඇත්තේ ඔහු දෙහිවල පොලිසියට අනුයුක්තව සේවය කළ බවත්. එල්.බී. ඉන්ද්‍රානි යන

අයව 2016.07.02 දින සොරකමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට පත් වී සිටි අවස්ථාවේදී කිසිදු පහරදීමක් සිදු නොකළ බවත්ය.

කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී අදාළ වගඋත්තරකරු විසින් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, පහරදීම සම්බන්ධයෙන් වන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවත්, දෙහිවල පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපතිතුමාට ලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා සහය වූ අතර පැමිණිලිකාරියගෙන් ප්‍රකාශයක් සටහන් කළ බවත්, ඉන් පසුව පැමිණිලිකාරියව අධිකරණයට ඉදිරිපත් කළ බවත්ය.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවැති විමර්ශනයේදී ඉදිරිපත් වී ඇති සමස්ථ කරුණු අනුව, ඉහත වගඋත්තරකාර උ.පො.ප සපුමල් ඒකනායක නිලධාරියා විසින් 2016.07.02 දින වින්දිත තැනැත්තියව අත්අඩංගුවට ගෙන ඇති බවට නිරීක්ෂණය වන අතර, වින්දිත තැනැත්තිය පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ බැටන් පොල්ලකින් ඇයගේ අත් වලට, කම්මුල් වලට සහ පිටට පහර දුන් බවයි. තවද එම පහරදුන් නිලධාරියා වන්නේ 2017.10.29 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයට සහභාගී වූ නිලධාරි වන උ.පො.ප ඉහත වගඋත්තරකාර උ.පො.ප සපුමල් ඒකනායක යන අය බව පැමිණිලිකාරිය හඳුනාගෙන ඇත. තමාට ඒකනායක නිලධාරියා පහරදුන් බව වින්දිත පාර්ශවය විසින් අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත ලබා දී ඇති රෝගී ඉතිහාසයේද සඳහන් වේ.

පැමිණිලිකාරිය පසු දිනම අධිකරණ වෛද්‍යවරයෙකු වෙත යොමු වී ඇති අතර, එහි පැමිණිල්ලේ දක්වා ඇති කරුණු වලට සමාන කරුණුම රෝගී ඉතිහාසයට ලබා දී ඇති බව රෝගී ඉතිහාසය කෙරෙහි අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වේ. තවද අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල දෙකක් ඇති බවත්,

1. දකුණු අත්බාහුවේ ඉහළින් වූ තැලීම් තුවාලය අතේ ඉහළ පිටුපස දක්වා 3×6 cm ප්‍රමාණයක විහිදී ඇති බවත්,

2. වම් පස ඉහළ පපු පෙදෙසේ පිටුපස සිට වම් අතේ බාහුව දක්වා 15×16 cm දුරට විහිදී ගිය තැලීමක් ඇති බවත් දක්වා ඇති අතර, එය ලබා දී ඇති රෝගී ඉතිහාසය වන අඩි 2½ ක් පමණ බැටන් පොල්ලකින් සිදුකළ පහරදීම හා සැසඳෙන බව වෛද්‍ය මතය ලෙස දක්වා ඇත. තවද එම තුවාල වින්දිත පාර්ශවය දක්වන පහරදීම් ආකාරය හා සැසඳේ

ඒ අනුව, අධිකරණ වෛද්‍ය වාර්තාවේ බරපතල නොවන තුවාල දෙකක් ඇති බවත්. එම තුවාල රෝගියාගේ ඉතිහාසය හා ගැලපෙන බවට අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇති බැවින් පහරදීමක් සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම වින්දිත තැනැත්තියට විරුද්ධව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 90502/2/10 යටතේ ගෘහ සේවිකාවක් වශයෙන් සිටියදී රුපියල් අසූදහසක් වටිනා ඇපල් වර්ගයේ ජංගම දුරකථන දෙකක්. ඩිජිටල් කැමරාවක් සොරා ගැනීම සම්බන්ධයෙන් නඩුවක් විභාග වන බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව සහ ඉදිරිපත් වී ඇති කරුණු අනුව, අගතියට පත් තැනැත්තිය අත්අඩංගුවේ සිටියදී වගඋත්තරකරුවන් විසින් පහරදී ඇති බවට අනාවරණය වන බැවින් එම පහරදීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම මෙම අගතියට පත් පාර්ශවය සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1. වින්දිත තැනැත්තියගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීම වෙනුවෙන් වගඋත්තරකාර උ.පො.ප සපුමල් ඒකනායක නිලධාරියා විසින් අගතියට පත් එම්.වී ඉන්ද්‍රාණි යන අයට රුපියල් 50,000/- (රුපියල් පනස්දහසක) මුදල්මය වන්දියක් ගෙවීමට කටයුතු කළ යුතුය.

2. අදාළ වගඋත්තරකරු සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිතුමා, නීතිපතිතුමා සහ ජාතික පොලිස් කොමිෂන සභාව වෙතද යොමුකරනු ලැබේ.

2021.12.08 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
2021 | 11 | 10

[illegible] Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත

1. පොලිස්පතිතුමා,
   පොලිස් මූලස්ථානය,
   කොළඹ 01.

2. නීතිපතිතුමා
   නීතිපති දෙපාර්තමේන්තුව
   කොළඹ 12.

3. සභාපති,
   ජාතික පොලිස් කොමිෂන් සභාව,
   බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
   කොළඹ 07

සැයු - අදාළ මුදල් 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

B/